සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே.ஆர். ஜயவர்தன நிலையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07

මගේ අංකය / எனது இல / My No. } MF/WBB/COM/2025

ඔබගේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2025.04.10

ජනමාධ්‍ය නිවේදනයයි

අස්වැසුම අප්‍රේල් මස ප්‍රතිලාභී දීමනා බැංකුගත කිරීම සම්බන්ධවයි.

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභී වැඩසටහන යටතේ සුදුසුකම් ලැබූ පවුල් 1,737,141 (දාහත් ලක්ෂ තිස් හත්දහස් එකසිය හතලිස් එකක්) සඳහා රුපියල් බිලියන 12.63 ක්ද සුදුසුකම් ලැබූ අස්වැසුම ප්‍රතිලාභී පවුල් තුළ සිටින අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් 580,944 කට රුපියල් බිලියන 2.9 ක්ද අප්‍රේල් මස 11 වන දින බැංකුගත කිරීමට නියමිතය. ඒ අනුව අදාල ප්‍රතිලාභීන්ට තමාට හිමි ප්‍රතිලාභී දීමනා අප්‍රේල් මස 11 වන දින සිට තම අස්වැසුම ප්‍රතිලාභී බැංකු ගිණුම මඟින් ලබාගත හැකිය.

02) 2025 අප්‍රේල් මස සිට අයවැය මඟින් රජය විසින් මෙතෙක් වැඩිහිටියන් සඳහා ලබාදෙන ලද රු. 3000 ක වැඩිහිටි දීමනාව රු. 5000 ක් දක්වා වැඩි කරන ලදී. ඒ අනුව එලෙස වැඩි කරන ලද දීමනාවද අස්වැසුම ප්‍රතිලාභී පවුල් තුළ සිටින වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා 2025 අප්‍රේල් මස සිටම ගෙවීමට කටයුතු කර ඇත.

ජයන්ත විජේරත්න
සභාපති / කොමසාරිස්